...ස්ත්‍රාත් අධිකරණය
3 ... 1987
අනුරාධපුරය.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත

---

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 02 වන දින]

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---

1987 ජූනි මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී**

---

**කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය**

මිළ : රු. 1.50 යි. තැපැල් ගාස්තුව : රු. 1.15 යි.

# 1987 අංක 29 දරන නැතැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 1987 ජූනි මස 02 වන දින.]

**එල්. ඩී.—ඕ. 70/83.**

**ඇතැම් නැතැත්තන් පුනරුත්ථාපනය කිරීමට සහ ඇතැම් දේපළ, කර්මාන්ත සහ ව්‍යාපාර අලුත්වැඩියා කිරීමට, ප්‍රතිසංස්කරණය කිරීමට සහ පුනරුත්ථාපනය කිරීමට සහායදීම පිණිස ද ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද අධිකාරියක් පිහිටුවීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වීමේ දිනය.*

1. මේ පනත 1987 අංක 29 දරන නැතැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වූ (මෙහි මින් මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

*නැතැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පිහිටුවීම.*

2. (1) (මෙහි මින්මතු "පුනරුත්ථාපන අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) නැතැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය නම් වූ මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පුනරුත්ථාපන අධිකාරිය, මේ පනතින් එයට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් එය විසින් නඩු පැවරීම ද එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ය.

*පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය.*

3. (1) පුනරුත්ථාපන අධිකාරිය අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන අධ්‍යක්ෂවරයන් පස් දෙනකුගෙන් යුක්ත වූ මණ්ඩලයකින් සමන්විත විය යුතු ය.

(2) කලින් කල අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පුනරුත්ථාපන අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම ද කළ යුතු ය. එවැනි සෑම විධානයකටම අනුකූලව ක්‍රියා කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

(3) අමාත්‍යවරයා විසින්, අධ්‍යක්ෂවරයන් අතුරින් එක් අයකු පුනරුත්ථාපන අධිකාරියේ සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ උපලේඛනයෙහි ඇති විධිවිධාන පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂවරයන්ගේ ධුර කාලය සම්බන්ධයෙන් ද එසේම පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය සම්බන්ධයෙන් ද පුනරුත්ථාපන අධිකාරියේ රැස්වීම් සහ මුද්‍රාව සම්බන්ධයෙන් ද අදාළ විය යුතු ය.

2—ඒ 096686—7,235 (87/04)

පුනරුත්ථාපන අධිකාරියේ කර්තව්‍ය.

4. මේ පනතේ අනෙකුත් විධිවිධානවලට යටත්ව පුනරුත්ථාපන අධිකාරියේ කර්තව්‍ය පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) හානියට පත් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා ආපසු අයකර ගනු නොලබන ප්‍රදානයක් දීමෙන් හෝ අවශ්‍යයයි පුනරුත්ථාපන අධිකාරිය අදහස් කරන වෙනත් ක්‍රමයකින් හෝ ආධාර කිරීම;

(ආ) යම් හානියට පත් දේපළක අයිතිකරුවකුට, එම දේපළ අලුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආපසු අයකර ගනු නොලබන ප්‍රදානයක් හෝ අලුත්වැඩියාව හෝ ප්‍රතිසංස්කරණය සඳහා අරමුදලින් දරන ලද වියදම් ආපසු අයකර ගැනීම නිසැකවම සහතික කිරීම පිණිස පුනරුත්ථාපන අධිකාරිය සහ ඒ අයිතිකරු අතර ඇති කර ගන්නා ලද එකඟත්වයක අඩංගු යුක්ති සහගත කොන්දේසිවලට යටත්ව ආධාර කිරීම;

(ඇ) හානි සිදු වූ දේපළක් වන යම් හානියට පත් දේපළක් අලුත්වැඩියා කිරීමට සහ ප්‍රතිසංස්කරණය කිරීමට එම දේපළෙහි අයිතිකරුට නොහැකි නම් හෝ ඔහු එසේ කිරීමට අකැමැති නම් සහ පුනරුත්ථාපන අධිකාරිය විසින් සියළු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගැනීමෙන් පසු අවශ්‍ය අලුත්වැඩියා කිරීම් සහ ප්‍රතිසංස්කරණ කිරීම් කරන ලෙස කුලී නිවැසියාට බලය පැවරීම සාධාරණ සහ යුක්ති සහගත බවට පුනරුත්ථාපන අධිකාරිය සෑහීමට පත් වන්නේ නම් එම කුලී නිවැසියාට ආධාර කිරීම;

(ඈ) ගොඩනැගිල්ලකින් හෝ ව්‍යුහයකින් යුක්ත වන යම් හානියට පත් දේපළක් කඩා දමන ලෙස හෝ ඉවත් කරන ලෙස නියෝග කිරීම;

(ඉ) යම් හානියට පත් කර්මාන්තයක හෝ ව්‍යාපාරයක අයිතිකරුවකුට, පුනරුත්ථාපන අධිකාරිය විසින් එකඟත්වයකට පැමිණෙන යම් සාධාරණ කොන්දේසියකට යටත්ව එම කර්මාන්තය හෝ ව්‍යාපාරය පුනරුත්ථාපනය කිරීම සඳහා ඔහුට ආධාර කිරීම සහ එම පුනරුත්ථාපනය කිරීමේ කාර්ය සඳහා වූ අරමුදලින්, දරන ලද යම් වියදමක් එම අයිතිකරුට ආපසු ගෙවීම.

පුනරුත්ථාපන අධිකාරියේ බලතල.

5. ස්වකීය කර්තව්‍ය ඉටුකිරීමේ කාර්ය සඳහා, පුනරුත්ථාපන අධිකාරිය විසින් පහත දැක්වෙන බලතල සියල්ල හෝ ඉන් සමක් ක්‍රියාත්මක කළ හැකි ය:—

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් යම් ආකාරයකින් අත් කර ගැනීම හා දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ආ) 22 වන වගන්තිය යටතේ වූ තීරණයක ප්‍රකාර රජය වෙත පැවරුනු හෝ 23 වන වගන්තිය යටතේ රජය වෙත නැවත පැවරුනු හානියට පත් දේපළක් ශුද්ධ කිරීම හෝ නැවත දියුණු කිරීම ;

(ඇ) ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යයි අධිකාරිය සලකන සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒවා ක්‍රියාත්මක කිරීම ;

(ඈ) මුදල්වලින් හෝ වෙනත් අයුරකින් වූ සියලු ත්‍යාග, ප්‍රදාන, පරිත්‍යාග හෝ සහනාධාර ලබා ගැනීම සහ ඒවා ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ දී අදාළ කර ගැනීම ;

(ඉ) අධිකාරියෙහි කර්තව්‍ය ඉටුකිරීමට ආනුෂංගික සියලු ක්‍රියා සහ දේ කිරීම.

6. (1) පුනරුත්ථාපන අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා සභාපතිවරයා විය යුතු ය. — නිලධරයන් සහ සේවකයන් පත් කිරීම.

(2) පුනරුත්ථාපන අධිකාරිය විසින් ස්වකීය කර්තව්‍ය ඉටුකිරීම සඳහා සහ මේ පනතේ පරිපාලනය සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි යයි සලකන නිලධරයන්, අනුයෝජිතයන් සහ සේවකයන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.

(3) පුනරුත්ථාපන අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ අනුප්‍රමාණ අනුව නිලධරයන්ට, සේවකයන්ට සහ අනුයෝජිතයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර එම නිලධරයන්, සේවකයන් සහ අනුයෝජිතයන් පුනරුත්ථාපන අධිකාරිය විසින් තීරණය කරනු ලබන ආකාරයේ සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(4) පුනරුත්ථාපන අධිකාරියේ ඉල්ලීම පිට, රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, පුනරුත්ථාපන අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා පුනරුත්ථාපන අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීම හෝ එවැනිම කැමැත්ත ඇතිව කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීම හෝ කරනු ලැබිය හැකි ය.

(5) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු, පුනරුත්ථාපන අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(6) රජයේ සේවයේ නියුක්ත යම් නිලධරයකු පුනරුත්ථාපන අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තියේ, (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ නිලධරයාට සහ ඒ නිලධරයා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(7) නිශ්චිත කාලසීමාවක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට ගිවිසුමක් එළඹ සිටින යම් තැනැත්තකු පුනරුත්ථාපන අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් අධිකාරියට සේවය කරනු ලබන යම් කාලසීමාවක්, ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) පුනරුත්ථාපන අධිකාරියේ ලේකම් විසින් අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු හෝ පළාත් පාලන ආයතනයක හෝ සංවර්ධන සභාවක වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු, ඒ සාමාජිකයාගේ, නිලධරයාගේ හෝ සේවකයාගේ සහ අවස්ථාවෝචිත පරිදි, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ හෝ පළාත් පාලන ආයතනයේ හෝ සංවර්ධන සභාවේ කැමැත්ත ඇතිව, පුනරුත්ථාපන අධිකාරිය විසින් එවැනිම කැමැත්ත ඇතිව තීරණය කරනු ලබන කාලයක් සඳහා පුනරුත්ථාපන අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය. නැතහොත් පුනරුත්ථාපන අධිකාරිය සහ අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන සේවා කොමිෂන් සභාව හෝ ඒ පළාත් පාලන ආයතනය හෝ සංවර්ධන සභාව විසින් එකඟ වන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ නියමයන් හා කොන්දේසි ඇතුළු යම් නියමයන් සහ කොන්දේසි මත, ඒ අධිකාරියට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

පුනරුත්ථාපන අධිකාරියේ අරමුදල.

7. (1) හානියට පත් තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම සඳහා සහ හානියට පත් දේපල අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) පහත සඳහන් මුදල් අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(අ) නියමිත දිනයේදී—

(i) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ හදිසි අවස්ථා (විනාශ වූ දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ) නියෝග මගින් පිහිටුවනු ලැබූ විදේශ අධිකාරියේ අරමුදලේ සහ;

(ii) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ හදිසි අවස්ථා (විවිධ විධිවිධාන සහ බලතල) නියෝග යටතේ පත් කරනු ලැබූ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයාගේ බැරට ඇති සියලු ශේෂ;

(ආ) මේ පනතේ කාර්ය සඳහා පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් ;

(ඇ) ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත කවර වූ හෝ ප්‍රභවයකින් පරිත්‍යාග, ප්‍රදාන හෝ තෑගි වශයෙන් අරමුදලට ලැබෙන සියලු මුදල් සහ අරමුදලින් දෙන ලද අත්තිකාරම් ආපසු ගෙවීම් වශයෙන් ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත පරිපාලනය කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී දරන ලද යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් සහ මේ පනතේ යම් විධිවිධානයකින් ගෙවීමට නියම කර ඇති සියලු මුදල් ද අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පුනරුත්ථාපන අධිකාරියේ ගිණුම් විගණනය.

8. (1) පුනරුත්ථාපන අධිකාරියේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් තබා ගැනීමට අධිකාරිය විසින් කටයුතු සැලසිය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

හානියට පත් දේපළ පවරා ගැනීම.

9. මේ පනතේ 22 වැනි වගන්තිය යටතේ වූ තීරණයක ප්‍රකාර රජය වෙත පැවරුණු හෝ මේ පනතේ 23 වන වගන්තියෙන් රජය වෙත නැවත පැවරුණු හෝ යම් හානියට පත් දේපළක, ව්‍යාපාරයක හෝ කර්මාන්තයක සන්තකය ගැනීම, ඒ සම්බන්ධයෙන් පුනරුත්ථාපන අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් සිදු කළ හැකි ය.

හානියට පත් දේපළ වලට බලයක් නොමැතිව ඇතුලුවීම.

10. (1) අදාළ දිනයේ දී හෝ එදිනට පසු, නීත්‍යානුකූල අවසරයක් නොමැතිව යම් හානියකට පත් දේපළකට ඇතුළුවන හෝ එවැනි දේපළක පදිංචිව සිටින යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, ජූරි සභාවක් නොමැතිව මහාධිකරණයක විනිශ්චයකාරවරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයක දී වරදකරු කිරීමේ දී අවුරුදු දහයකට නොඅඩු කාල සීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට යටත් විය යුතු ය.

(2) යම් හානියට පත් දේපළක යම් තැනැත්තකු අනවසරයෙන් පදිංචිව සිටින බවට හෝ 11 වන වගන්තිය යටතේ ස්වකීය අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලැබ ඇත්තේ යම් කුලී නිවැසියකුගේ ද එම කුලී නිවැසියාට යම් හානියට පත් දේපළකට ඇතුළුවීමට හෝ එම දේපළෙහි දිගටම පදිංචිව සිටීමට හෝ ඉඩ නොදෙන බවට (මෙහි මින් මතු "ලේකම්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා සෑහීමට පත් වන අවස්ථාවක—

(අ) යම් හානියට පත් දේපළක යම් තැනැත්තකු අවසරයක් නොමැතිව සන්තකය දරා සිටින අවස්ථාවක දී එම තැනැත්තා එයින් ඉවත් කර, එම දේපළෙහි පදිංචිව සිටීමට හිමිකම් ඇති තැනැත්තා එම දේපළෙහි පදිංචි කරවීමට ; සහ

(ආ) 11 වන වගන්තිය යටතේ සිය අයිතිවාසිකම් ආරක්ෂා කරනු ලැබ ඇත්තේ යම් හානියට පත් දේපළක යම් කුලී නිවැසියකුගේ ද එම කුලී නිවැසියාට එම දෙපළට ඇතුළුවීමට හෝ එම දේපළෙහි දිගටම පදිංචිව සිටීමට ඉඩ නොදෙන අවස්ථාවක දී එම කුලී නිවැසියාට නැවත සන්තකය ලබා දීමට

පොලිස් පරීක්ෂකවරයකුට නොඅඩු නිලයක් දරන පොලිස් නිලධරය කුට ලේකම්වරයා විසින් ලිඛිතව විධානය කළ හැකි ය. එවැනි සෑම විධානයකටම අනුකූලව ක්‍රියා කිරීම ඒ සෑම පොලිස් නිලධරයකුගේ ම කාර්ය විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරනු ලැබූ විධානයක් අනුව ක්‍රියා කරන පොලිස් නිලධරයකු විසින්, යම් හානියට පත් දේපළක අවසරයක් නොමැතිව පදිංචිව සිටින යම් තැනැත්තකු ඉවත් කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි බලය පාවිච්චි කළ හැකි අතර ඒ කාර්ය සඳහා ඔහුට සන්නද්ධ හමුදාවල ආධාරය ලබා ගැනීමට හිමිකම් තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ යම් දේපළකින් ඉවත් කරනු ලැබ එහි පදිංචිය සඳහා හිමිකම් ඇති බවට අයිතිවාසිකම් කියන යම් තැනැත්තකුට එම දේපළෙහි හෝ එම දේපළ සම්බන්ධයෙන් යම් අයිතියක් ඇත්නම් එම අයිතිය ලබා ගැනීම සඳහා යම් අධිකරණයක නඩු පැවරීමට ඇති අයිතියට, මේ වගන්තියේ ඇති කිසිවකින් හානියක් සිදුවන ලෙස නොසැලකිය යුතු ය. එවැනි යම් නඩු කටයුත්තක්, එසේ ඉවත් කරනු ලැබීමෙන් මාස දෙකක් ඇතුළත පවරනු ලැබිය යුතු ය.

හානියට පත් දේපළක හෝ එම දේපළක් සම්බන්ධයෙන් කුලී නිවැසියකුගේ අයිතිවාසිකම් වලට අදාළ විධිවිධාන.

11. (1) හානියට පත් යම් දේපළකට අයත්වන යම් ස්ථානයකට (මේ වගන්තියේ "ගෙවල් කුලී පනත" යනුවෙන් සඳහන් කරනු ලබන) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත අදාළ වන අවස්ථාවක —

(අ) අදාළ දිනයට පෙරාතුවම වූ දිනයෙහි දී එම ස්ථානයේ කුලී නිවැසියාව සිටි යම් තැනැත්තකුට එම ස්ථානයට ඇතුළු වී එහි පදිංචිවීමට හිමිකම් තිබිය යුතු අතර එම ස්ථානයට ඇතුළු වී එහි පදිංචිවීමට එම කුලී නිවැසියාට අවසර දීම ගෙවල් හිමියාගේ කාර්ය විය යුතු ය ;

(ආ) අදාළ දිනයෙන් ආරම්භ වී 1984 ජූලි මස 31 වන දින හෝ එම ස්ථානය අලුත් වැඩියා කළ නැතහොත් ප්‍රතිසංස්කරණය කළ දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන කාලසීමාව ඇතුළත් එම තැනැත්තා එම ස්ථානය සම්බන්ධයෙන් ගෙවල් කුලිය ගෙන නොතිබූ ඇති ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ඇ) අදාළ දිනයෙන් ආරම්භ වී 1984 ජූලි මස 31 වන දින හෝ එම ස්ථානය අලුත්වැඩියා කළ තැනතොත් ප්‍රතිසංස්කරණය කළ දිනය හෝ යන දින දෙකෙන් කලින් එළඹෙන දිනෙන් අවසන් වන කාල සීමාව සම්බන්ධයෙන් ගෙවල් කුලී පනතේ 28 වන වගන්තිය යටතේ එම ස්ථානයෙන් එම කුලී නිවැසියා ඉවත් කිරීම සඳහා කිසිම නඩු කටයුත්තක් නොපැවරිය යුතු ය;

(ඈ) ආපසු අය කර ගනු නොලබන ප්‍රදානයක් ලෙස අරමුදලින් ලැබුණු යම් මුදලකින් හැර, සභාපතිවරයා විසින් අවසර දෙනු ලැබූ හෝ පිළිගනු ලැබූ මුදල් ප්‍රමාණයක් වියදම් කර ගෙවල් හිමියා විසින් එම ස්ථානය අලුත්වැඩියා කරනු ලැබූ හෝ ප්‍රතිසංස්කරණය කරනු ලැබූ අවස්ථාවක එම අලුත්වැඩියාව හෝ ප්‍රතිසංස්කරණය නිසි අයුරින් ඉටු කර ඇති බවට සභාපතිවරයා සහතිකයක් නිකුත් කරන්නේ නම්, එම ස්ථානයේ නියමිත ගෙවල් කුලිය අවුරුදු දහයක කාල සීමාවක් සඳහා සභාපතිවරයා විසින් අවසර දෙනු ලැබූ හෝ පිළිගනු ලැබූ මුදලට වඩා සෑම අවුරුද්දකම සියයට දොළහකින් වැඩි කරනු ලැබිය යුතු ය. ගෙවල් කුලී පනතේ කාර්ය සඳහා එවැනි සෑම වැඩි කිරීමක් ම අවසර දෙනු ලැබූ වැඩි කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඉ) ඒ ස්ථානය අලුත්වැඩියා කිරීම හෝ ඒ ස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම ඉඩම් හිමියා විසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක, ආපසු අය කර ගනු නොලබන ප්‍රදානයක් ලෙස අරමුදලින් ලැබුණු යම් මුදලකින් හැර, සභාපතිවරයා විසින් බලය දෙනු ලැබූ මුදල් ප්‍රමාණයක් වියදම් කර කුලී නිවැසියා විසින් එම ස්ථානය අලුත්වැඩියා කරනු ලැබ හෝ ප්‍රතිසංස්කරණය කරනු ලැබ, එම අලුත්වැඩියාව හෝ ප්‍රතිසංස්කරණය නිසි අයුරින් ඉටු කර ඇති බවට සභාපතිවරයා සහතිකයක් නිකුත් කරනු ලැබූ විට, සියලු අවස්ථානුගත කරුණු සැළකිල්ලට ගෙන සාධාරණ සහ යුක්ති සහගත යයි සභාපතිවරයාට හැඟෙන කොටස් මුදල්වලින් සභාපතිවරයා විසින් අවසර දෙනු ලැබූ මුදල් ප්‍රමාණයක්, එම ස්ථානය වෙනුවෙන් ගෙවිය යුතු ගෙවල් කුලියෙන් අඩු කර ගැනීමට කුලී නිවැසියාට හිමිකම තිබිය යුතු ය:

එසේ වුව ද එම ස්ථානය අලුත්වැඩියා කිරීමට හෝ ප්‍රතිසංස්කරණය කිරීමට කුලී නිවැසියා එකඟ වී, හානියට පත් දේපළ අලුත්වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම එම කුලී නිවැසියාගේ වියදමින් සිදු කරන බවට මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදනු ලැබූ හදිසි අවස්ථා (විනාශ වූ දේපළ ව්‍යාපාර හෝ කර්මාන්ත

පුනරුත්ථාපනය කිරීමේ) නියෝග මගින් පිහිටුවනු ලැබූ වෙදෙක අධිකාරියට එය කුලී නිවැසියා පොරොන්දුවක් දී ඇති අවස්ථාවක, මේ ඡේදය යටතේ කිසිම සහනයක් ඉල්ලීම සඳහා කුලී නිවැසියාට හිමිකමි නොතිබිය යුතු ය.

(2) ගෙවල් කුලී පනත අදාළ නොවන යම් ස්ථානයක්, හානියට පත් යම් දේපළකට අයත්වන අවස්ථාවක, අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එම ස්ථානයෙහි කුලී නිවැසියාව සිටි යම් තැනැත්තකු, අදාළ දිනයෙන් ආරම්භ වී එම ස්ථානය අලුත්වැඩියා කළ නැතහොත් ප්‍රතිසංස්කරණය කළ දිනයෙන් අවසන් වන කාල සීමාව සම්බන්ධයෙන්, ගෙවල් කුලිය හිඟ තබා ඇති ලෙස සලකනු නොලැබිය යුතු ය.

(3) යම් ස්ථානයක් අලුත්වැඩියා කිරීමේ නැතහොත් ප්‍රතිසංස් කරණය කිරීමේ හේතුවෙන් (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ යම් ස්ථානයක සම්මත කුලිය වැඩි කරනු ලැබූ අවස්ථාවක දී, එම අලුත්වැඩියා කිරීම නැතහොත් ප්‍රතිසංස්කරණය කිරීම සම් බන්ධයෙන් ගෙවල් කුලී පනතේ 5 වන වගන්තිය යටතේ ගෙවල් කුලිය වැඩි කිරීම පිණිස ඉල්ලීමක් කිරීමට එම ස්ථානයේ ගෙවල් හිමියාට හිමිකමක් නොතිබිය යුතු ය.

(4) අදාළ දිනයේ දී (4 වන වගන්තිය යටතේ තීරණය කරනු ලැබූ) සම්මත කුලිය රුපියල් සියයට අඩු වූ යම් ස්ථානයක සම්මත කුලිය, (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ කරනු ලැබූ වැඩි කිරීමක හේතුවෙන් මසකට රුපියල් සියයකට වැඩි මුදලකට වැඩි කර ඇති අවස්ථාවක දී, ගෙවල් කුලී පනතේ 22 වන වගන් තියේ (2) වන උපවගන්තියෙහි දක්වා ඇති යම් හේතුවක් මත කුලී නිවැසියා එම ස්ථානයෙන් ඉවත් කිරීම සඳහා යම් නඩුවක් හෝ නඩු කටයුත්තක් පැවරීමට එම ගෙවල් හිමියාට හිමිකමක් නොතිබිය යුතු බව, සැක ඇතිවීම වැළැක්වීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා යම් ස්ථානයක් යම් දිනයක දී අලුත්වැඩියා කරනු ලැබූ බවට හෝ ප්‍රතිසංස්කරණය කරනු ලැබූ බවට සභාපතිවරයාගේ අත්සන සහිත සහතිකයක්, එම දිනයේ දී එම ස්ථානය අලුත්වැඩියා කරනු ලැබූ බවට හෝ ප්‍රතිසංස්කරණය කරනු ලැබූ බවට බැලු බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

අදාළ දිනයට පසු හානියට පත් දේපළ විකිණීම සම්බන්ධයෙන් එන නඩු කටයුතු.

12. (1) අදාළ දිනයෙන් පසු එහෙත් 1983 දෙසැම්බර් 31 දිනයට පෙර යම් හානියට පත් දේපළක් විකුණූ යම් තැනැත්තකු විසින් නියමිත දිනයට පසු මාස දෙකක කාලය ඇතුළත, එම විකිණීම ඉවත දමන ආඥාවක් සඳහා හෝ එම දේපළ විකුණනු ලැබූ මිල සහ එම දේපළෙහි වෙළෙඳ අගය අතර යම් වෙනසක් ඇත්නම් එම වෙනස අයකර ගැනීම සඳහා හෝ එම දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ අධිකරණ බලය ඇති අධිකරණයෙහි නඩුවක් පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් නඩුවක් පවරනු ලැබූ අවස්ථාවක, එම දේපළ විකුණනු ලැබූ මිල එම දේපළෙහි වෙළෙඳ අගයට වඩා අඩු බවට අධිකරණය සෑහීමට පත් වන්නේ නම්, අධිකරණය විසින් එම විකිණීම ඉවත දමමින් සහ අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී එම දේපළෙහි සන්තකය දැරුවේ යම් නැනැත්තෙක් ද එම නැනැත්තාට එම දේපළෙහි සන්තකය නැවත ලබා දෙමින් හෝ විකුණූ මිල සහ වෙළෙඳ අගය අතර ඇති වෙනස ගෙවීමට හෝ ආඥා කළ හැකි ය. අධිකරණය විසින් විකිණීමක් ඉවත දමමින් ආඥාවක් කරනු ලබන අවස්ථාවක, විකුණූ මිල ආපසු ගෙවීමට ද අධිකරණය ආඥා කළ යුතු ය.

(3) යම් නිශ්චල දේපළක් හානියට පත් දේපළක් ද නැද්ද යන බවට සභාපතිවරයාගේ අත්සන යටතේ වූ සහතිකයක් 10 වන වගන්තිය යටතේ හෝ (1) වන උපවගන්තිය යටතේ හෝ පවරනු ලැබූ යම් නඩු කටයුත්තක දී නීතියෙහි ලා පිළිගත යුතු සාක්ෂියක් විය යුතු අතර එහි සඳහන් කරුණුවල බැලු බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

(4) මේ වගන්තියේ යම් හානියට පත් දේපළක "වෙළෙඳ අගය" යන්නෙන් අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එම දේපළ විවෘත වෙළෙඳ පොළෙහි විකුණනු ලැබුවේ නම් එය විකුණනු ලැබිය හැකි මිලෙන් අදාළ දිනයට පෙරාතුව ම වූ දිනයේ දී එම දේපළෙහි තත්ත්වයට එය ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය යයි අධිකරණයට පෙනී යන මුදල අඩු කළ විට ඉතිරිවන මුදල අදහස් වේ.

**13.** (1) සභාපතිවරයා විසින්, ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම සඳහා හෝ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි යයි සලකනු ලබන යම් තොරතුරක් සැපයීමට හෝ එවැනි යම් පොතක්, ලේඛනයක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට, ලිඛිත දැන්වීමකින් යම් නැනැත්තකුට නියම කරනු ලැබිය හැකි අතර එවැනි තොරතුරක් සැපයීමට හෝ එවැනි පොතක්, ලේඛනයක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කිරීමට යම් ලිඛිත නීතියක විධිවිධානවලින් තහනම් කරනු ලැබ ඇත්නම් මිස, එම දැන්වීමට එකඟව ක්‍රියා කිරීම එවැනි දැන්වීමක් ලැබුණු යම් නැනැත්තකුගේ කාර්ය විය යුතු ය.

**තොරතුරු ඉල්ලීම සඳහා සභාපතිවරයාට බලතල.**

(2) අවස්ථාවෝචිත පරිදි යම් තොරතුරක් සපයන හෝ යම් පොතක්, ලේඛනයක් හෝ ලියවිල්ලක් ඉදිරිපත් කරන නැනැත්තකුගේ කැමැත්ත ඇතිව මිස හෝ මේ පනත යටතේ සභාපතිවරයාගේ කර්තව්‍ය ඉටු කිරීමේ දී මිස හෝ මේ වගන්තිය යටතේ නිකුත් කරනු ලබන දැන්වීමකට එකඟව ක්‍රියා කරමින් සපයනු ලබන කිසිම තොරතුරක් හෝ එසේ ඉදිරිපත් කරනු ලබන යම් පොතක, ලේඛනයක හෝ ලියවිල්ලක ඇතුළත් කරුණු ප්‍රසිද්ධ කිරීම හෝ වෙනත් යම් නැනැත්තකුට දැන්වීම සභාපතිවරයා විසින් නොකළ යුතු ය.

හානියට පත් ගොඩනැගිලි කඩා දැමීම.

14. (1) හානියට පත් දේපළකට අයත් ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක්—

(අ) එයට ගිනි තැබීමේ හෝ වෙනත් අයුරින් අලාභ කරනු ලැබීමේ හේතුවෙන් මනුෂ්‍ය වාසයට නුසුදුසුව ඇති අවස්ථාවක හෝ

(ආ) අලුත්වැඩියා කිරීමට නොහැකිව ඇති අවස්ථාවක දී

සභාපතිවරයාගේ විධානයේ දැක්වෙන කාලසීමාවක් ඇතුළත එම ගොඩනැගිල්ල කඩා දමා එහි සුන්බුන් ඉවත් කිරීමට සභාපතිවරයා විසින් එම ගොඩනැගිල්ලේ අයිතිකරුට ලිඛිතව විධානය කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ විධානයකට එකඟව ක්‍රියා කිරීම යම් තැනැත්තකු පැහැර හරින අවස්ථාවක දී, සභාපතිවරයා විසින් එම ගොඩනැගිල්ල කඩා දැමීමට කටයුතු සැලැස්විය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ යම් ගොඩනැගිල්ලක් හෝ එහි කොටසක් කඩා දැමූ අවස්ථාවක, පුනරුත්ථාපන අධිකාරිය විසින් එම කඩා දැමීමෙන් පසු ඉතිරිවන ද්‍රව්‍ය විකිණීමටද, එම විකිණීමෙන් ලැබෙන මුදල්, ගොඩනැගිල්ල කඩා දැමීම සහ එහි සුන්බුන් ඉවත් කිරීම සඳහා දරන ලද වියදම් පියවීම සඳහා යෙදවීම ද එසේ ම යම් ඉතිරි මුදලක් ඇත්නම් එය එම ගොඩනැගිල්ලේ අයිතිකරුට ගෙවීම ද නීත්‍යනුකූල වන්නේ ය.

හානියට පත් දේපළ වල පදිංචිය සහ ඒවා අලුත් වැඩියා කිරීම.

15. (1) පුනරුත්ථාපන අධිකාරිය විසින් ලිඛිතව බලය පවරනු ලැබ ඇත්නම් මිස, කිසිම තැනැත්තකු විසින් මේ වගන්තිය අදාළ වන යම් හානියට පත් දේපළකට ඇතුළුවීම හෝ එහි පදිංචිවීම නොකළ යුතු ය.

(2) කිසිම තැනැත්තකු විසින්—

(අ) පුනරුත්ථාපන අධිකාරිය විසින් ලිඛිතව බලය පවරනු ලැබ ඇත්නම් මිස ; සහ

(ආ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත, මහා නගර සභා ආඥාපනත, නගර සභා ආඥාපනත, 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත හෝ වෙනත් යම් නීතියක් යටතේ ලබා ගැනීමට ඔහුට නියම කරනු ලැබ ඇති යම් අනුමතයක් ලබාගෙන ඇත්නම් මිස

මේ වගන්තිය අදාළ වන්නේ යම් හානියට පත් දේපළකට ද එම දෙපළ අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම, නැවත සෑදීම හෝ කඩා දැමීම සිදු නොකළ යුතු ය.

(3) මේ පනතේ 22 වන වගන්තිය යටතේ වූ තීරණයක ප්‍රකාර රජය වෙත පැවරුණු හෝ 21 වන වගන්තිය යටතේ රජය වෙත නැවත පැවරුණු හෝ හානියට පත් දේපළවලට මේ වගන්තිය අදාළ වේ.

**16. (1) පුනරුත්ථාපන අධිකාරිය—**

**(අ) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා ආණ්ඩුවේ ආයතනයක්** ලෙස සලකනු ලැබෙය යුතු ය; තව ද

(ආ) ඒ පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි (ග) ඡේදයෙහි කාර්ය සඳහා, මුදල් හා ආරක්ෂක ආඥාපනත යටතේ පිහිටුවනු ලැබූ විදේශ ආධිකාරියේ කාර්යවලට **සමාන කාර්ය ඉටු කරන ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක්** ලෙස සලකනු ලැබිය යුතු ය.

1979 අංක 28 දරන දේශීය ආදායම් පනත **පුනරුත්ථාපන අධිකාරියට අදාළ වීම.**

(2) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියෙහි ඇති (ආ) ඡේදයේ කාර්ය සඳහා, අරමුදල ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් පිහිටුවනු ලැබූ අරමුදලක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ කාර්ය සඳහා අරමුදලට කරන ලද සෑම පරිත්‍යාගයක්ම ආණ්ඩුව වෙත කරනු ලැබූ පරිත්‍යාගයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

17. දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා **පුනරුත්ථාපන අධිකාරියේ සියලු අධ්‍යක්ෂවරුන්, නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.**

අධ්‍යක්ෂවරයන් සහ නිලධරයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව.

18. අල්ලස් පනතේ අර්ථානුකූලව පුනරුත්ථාපන අධිකාරිය උපලේඛනගත ආයතනයක් විය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඊට අනුව තේරුම් ගත යුතු ය.

පුනරුත්ථාපන අධිකාරිය, අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් විය යුතු බව.

**19. (1) මේ පනත යටතේ පුනරුත්ථාපන අධිකාරියේ ලේකම්** වරයා, සභාපතිවරයා, අධ්‍යක්ෂවරයා හෝ වෙනත් නිලධරයකු හෝ **සේවකයකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලදැයි** සැලකෙන හෝ අත්හරිනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම නොකළ යුතු ය.

ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

(2) මේ පනත යටතේ (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින් සිදු කරන ලද හෝ සිදු කරන ලදැයි සැලකෙන හෝ අත්හරිනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කරන ලද යම් වියදමක්, එම වියදම් එම නඩුවේ දී තමා වෙත ගෙවනු නොලැබුවේ නම් හිස, එම ක්‍රියාව සද්භාවයෙන් සිදු කරනු ලැබූ බව හෝ කරන ලදැයි සැලකෙන බව හෝ අත්හරිනු ලැබූ බව අධිකරණය නිරණය කරයි නම්, එම මුදල අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

වැරදි.

20. (අ) පුනරුත්ථාපන අධිකාරිය විසින් කරනු ලැබූ යම් විධානයකට හෝ පනවනු ලැබූ යම් නියමයකට අනුකූලව ක්‍රියා කිරීම ප්‍රතික්ෂේප කරන හෝ පැහැර හරින ; හෝ

(ආ) 9 වන වගන්තියෙන් හෝ 10 වන වගන්තියෙන් තමා වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී, පුනරුත්ථාපන අධිකාරිය විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට හෝ පොලිස් නිලධරයකුට හෝ සන්නද්ධ හමුදාවල සාමාජිකයකුට විරුද්ධව ක්‍රියා කරන හෝ අවහිර කරන ;

(ඇ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන හෝ එවාට අනුකූලව ක්‍රියා කිරීම පැහැර හරින

ඕනෑම තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු, ප්‍රකාශිතවම අන්‍යාකාරයෙන් විධිවිධාන සලස්වා ඇත්නම් මිස, රුපියල් දසදාහකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාල සීමාවක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

පුද්ගල මණ්ඩල වලින් සිදු කරන වැරදි.

21. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් සිදු කරනු ලබන අවස්ථාවක—

(අ) එම මණ්ඩලය සංස්ථාපිත මණ්ඩලයක් නම් එම සංස්ථාපිත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයෙක්ම එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය ; තව ද

(ආ) එම මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, එම ව්‍යාපාර ආයතනයේ සෑම හවුල්කරුවෙක්ම එම වරදට, වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද, එම අධ්‍යක්ෂවරයාගේ හෝ හවුල්කරුගේ දැනුම නොමැතිව ඒ වරද සිදු කරනු ලැබූ බවට හෝ එම වරද සිදු කිරීම වැළැක්වීමට තමා උද්යෝගයෙන් ක්‍රියා කළ බවට හෝ ඔහු ඔප්පු කරයි නම් එම අධ්‍යක්ෂවරයා හෝ හවුල්කරු මේ පනත යටතේ වූ වරදකට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

හදිසි අවස්ථා නියෝග ප්‍රකාර රජය සතු කරන ලද හානියට පත් දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්ත අවසන් කිරීම.

22. (1) මහජන ආරක්ෂක ආඥාපනත යටතේ සාදන ලද හදිසි අවස්ථා (හානියට පත් දේපළ, ව්‍යාපාර සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ) නියෝග ප්‍රකාර රජය වෙත පවරා ගන්නා ලද හානි සිදුවූ දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්ත අතුරින් —

(අ) පහත සඳහන්. එනම්—

(i) අළුත්වැඩියා කිරීම් හෝ ප්‍රතිසංස්කරණය කිරීම් ආරම්භ නොකරන ලද ;

(ii) අලුත්වැඩියා කිරීම් නැතහොත් ප්‍රතිසංස්කරණය කිරීම් ආරම්භ කොට ඇති නමුත් ඒ අලුත්වැඩියා කිරීම් නැතහොත් ප්‍රතිසංස්කරණය කිරීම් සම්පූර්ණ නොකරන ලද ;

(iii) එහි කුලී නිවැසියා වෙත සන්තකය ආපසු භාර නොදෙන ලද ; හෝ

(iv) නියමිත දිනයේදී නොනිමි විභාගයකට භාජනව පවත්නා ; හෝ

හානියට පත් යම් දේපළක් ; සහ

(ආ) පහත සඳහන්, එනම්—

(i) පුනරුත්ථාපනය නැතහොත් ප්‍රතිසංස්කරණය ආරම්භ නොකරන ලද ;

(ii) පුනරුත්ථාපනය නැතහොත් ප්‍රතිසංස්කරණය ආරම්භ කොට ඇති නමුත් සම්පූර්ණ නොකරන ලද ;

(iii) එහි කුලී නිවැසියා වෙත සන්තකය ආපසු භාර නොදෙන ලද ;

(iv) නියමිත දිනයේදී නොනිමි විභාගයකට භාජනව පවත්නා ; හෝ

හානියට පත් යම් ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක්

බවට සභාපතිවරයා විසින් ලියවිල්ලක් මගින් තීරණය කරනු ලබන හානියට පත් දේපළක්, ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් හැර හානියට පත් අන් සෑම දේපළක්, ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් ම, නියමිත දින සිට බලපවත්වන සේ අවසන් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බැහැර කරන ලද යම් දේපළක්, ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක්—

(අ) එම දේපළ අළුත්වැඩියා කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සම්පූර්ණ කර ඇති බවට හෝ එම දේපළෙහි නීත්‍යනුකූල කුලී නිවැසියා වෙත එහි සන්තකය ආපසු භාර දී ඇති බවට ; හෝ

(ආ) එම ව්‍යාපාරය හෝ කර්මාන්තය පුනරුත්ථාපනය කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කර ඇති බවට නැතහොත් සම්පූර්ණ කර ඇති බවට

සභාපතිවරයා සෑහීමට පත්වන අවස්ථාවක, ලියවිල්ලකින් වූ ප්‍රකාශයක් මගින් කිනම් වේලාවක වුව ද අවසන් කිරීමේ බලය සභාපතිවරයාට තිබිය යුතු ය. එවැනි සෑම ප්‍රකාශයක් ම අවසානාත්මක හා තීරණාත්මක වන අතර, කිසිදු අධිකරණයක දී ඒය ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(3) යම් හානියට පත් දේපළක්, ව්‍යාපාරයක් හෝ කර්මාන්තයක් (1) වන උපවගන්තිය ක්‍රියාත්මක වීමේ ප්‍රකාර හෝ (2) වන උපවගන්තිය යටතේ අවසන් කළ විට, එම දේපළ, ව්‍යාපාරය හෝ කර්මාන්තය කිසිවිටෙක රජය වෙත පවරා තිබුණු ලෙස සලකනු නොලැබිය යුතු අතර, එවැනි යම් දේපළක, ව්‍යාපාරයක හෝ කර්මාන්තයක හෝ ඒ පිළිබඳ යම් අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් සම්බන්ධයෙන් පැන නගින යම් ප්‍රශ්නයක් ඒ අනුව විසඳිය යුතු අතර, එම දේපළ, ව්‍යාපාරය හෝ කර්මාන්තය රජය වෙත සතු

කෙරුණු දිනයේ දී එම දේපළ, ව්‍යාපාරය හෝ කර්මාන්තය සම්බන්ධයෙන් පැවති සෑම වැඩපිළිවෙලක් ම, ගිවිසුමක් ම හෝ නොතාරිස්වරයකු විසින් ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් ම එම උපවගන්තියේ ක්‍රියාත්මක වීමෙන් අලුත කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

අත්සතු කරනු ලැබූ දේපළ නැවත පවරා ගැනීම.

23. මහජන ආරක්ෂක ආඥා පනත යටතේ සාදනු ලැබූ හදිසි අවස්ථා (විනාශවූ දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ) නියෝග ප්‍රකාර රජය වෙත පැවරුණු යම් දේපළක, ව්‍යාපාරයක හෝ කර්මාන්තයක අයිතිය, අදාළ දිනයට පෙරාතුවම වූ දිනයේ දී එම දේපළ, ව්‍යාපාරය හෝ කර්මාන්තයේ අයිතිකරු විසින් මෙම නියෝගය මගින් පිහිටුවනු ලැබූ විධායක අධිකාරියට එම දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්තයේ අයිතිකරු විසින් දෙන ලද පොරොන්දුවක් මත, එම දේපළ, ව්‍යාපාරය හෝ කර්මාන්තයේ අයිතිය නැවත පවරනු ලැබ ඇති අවස්ථාවක, එම පොරොන්දුවට එකඟව ක්‍රියා කර නොමැති බවට ලේකම්වරයා සෑහීමට පත් වන්නේ නම්, ලේකම්වරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් එම දේපළ රජය වෙත නැවත පවරනු ලැබිය හැකි ය.

බලය පැවරීම.

24. (1) පුනරුත්ථාපන අධිකාරිය මගින්, ස්වකීය බලතල හෝ කාර්යවලින් කිසිවක් එහි සභාපතිවරයාට හෝ වෙනත් යම් අධ්‍යක්ෂවරයකුට හෝ එහි වෙනත් සේවා නියුක්තයකුට පැවරිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පුනරුත්ථාපන අධිකාරියේ බලතල සහ කාර්ය පවරනු ලැබ ඇති සභාපතිවරයා, අධ්‍යක්ෂවරයා හෝ සේවා නියුක්තයා, පුනරුත්ථාපන අධිකාරියේ සාමාන්‍ය හෝ විශේෂ විධානවලට යටත්ව එසේ පැවරුණු බලතල ක්‍රියාත්මක කිරීම ද කාර්ය ඉටු කිරීම ද කළ යුතු ය.

නියෝග.

25. (1) නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇත්තා වූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ සියලු කරුණු සඳහා අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර එම නියෝග පළ කරනු ලබන දිනයේ දී හෝ එම නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි මතු දිනයක දී හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. අනුමත කරනු නොලැබූ සෑම නියෝගයක්ම එම නියෝගය යටතේ කලින් කරනු ලැබූ කිසිවකට හානියක් නොවන පරිදි, අනුමත කරනු නොලැබූ දින සිට අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් නියෝගයක් අවලංගු කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත 15
පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත

26. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි— අර්ථ නිරූපණය.

"හානියට පත් දේපළ" යන්නෙන් 1983 ජූලි 24 වන දින හෝ එදිනට පසු සහ 1983 අගෝස්තු 8 වන දිනට පෙර කැරලි කෝලාහල හෝ ජන කැළඹීම්වලින් හානි සිදු වූ හෝ විනාශ කරන ලද යම් දේපළක් අදහස් වන අතර, කැරලි කෝලාහල හෝ ජන කැළඹීම්වලින් හානි සිදු වූ හෝ විනාශ කරන ලද දේපළ ලෙස අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලබන වෙනත් යම් දේපළක් ඊට ඇතුළත් වේ;

"හානියට පත් ව්‍යාපාර හෝ කර්මාන්ත" යන්නෙන් 1983 ජූලි 24 වන දින හෝ එදිනට පසු සහ 1983 අගෝස්තු 8 වන දිනට පෙර කැරලි කෝලාහල හෝ ජන කැළඹීම්වලින් අලාභ හානි සිදු වූ විනාශ කරන ලද කර්මාන්ත හෝ වෙළෙඳ ස්වරූපයේ වූ යම් ව්‍යවසායක් අදහස් වන අතර එම ව්‍යවසායේ කාර්ය සඳහා ප්‍රයෝජනය ගනු ලැබූ සියලු නිශ්චල සහ චංචල දේපළ එයට අයත් වේ;

"හානියට පත් තැනැත්තා" යන්නෙන් 1983 ජූලි 24 වන දින හෝ එදිනට පසු සහ 1983 අගෝස්තු 8 වන දිනට පෙර කැරලි කෝලාහල හෝ ජන කැළඹීම්වලින් ස්වකීය නිශ්චල හෝ චංචල දේපළවලට හානි සිදු වූ හෝ විනාශයට පත් වුනු හෝ ශාරීරික වශයෙන් හානි පැමිණුන යම් තැනැත්තෙක් අදහස් වේ;

"සභාපතිවරයා" යන්නෙන් 3 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ පුනරුත්ථාපන අධිකාරියේ සභාපතිවරයා අදහස් වේ;

"ස්ථානය" යන්නට 1972 අංක 7 දරන ගෙවල් කුලී පනතේ ඇති අර්ථයම ඇත;

"අදාළ දිනය" යන්නෙන් 1983 ජූලි 24 වන දින අදහස් වේ.

උපලේඛනය

3 (4) වන වගන්තිය

පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂවරුන්ට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සාමාජිකයකු නම්; හෝ

(ආ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු ලෙස ප්‍රකාශිත නම්; හෝ

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලාත්මක වන යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් තැනැත්තකු හෝ බංකොලොත්භාවය ලැබූ තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබූ බංකොලොත්කාරයකු හෝ වස්තු භංගත්වයට පත් තැනැත්තකු නම්; හෝ

(ඈ) ශ්‍රී ලංකාවේන් හෝ වෙනත් යම් රටකින් පනවනු ලැබූ සිර දඬුවමක් ගත කරන තැනැත්තකු නම්

ඔහු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබීමට හෝ එම තනතුරෙහි දිගටම සේවය කිරීමට නුසුදුසු විය යුතු ය.

2. අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියකින්, ඕනෑම අධ්‍යක්ෂවරයකුට පුනරුත්ථාපන අධිකාරියෙන් ඉල්ලා අස්විය හැකි ය.

3. (3)(1) වන වගන්තිය යටතේ අධ්‍යක්ෂවරයකු ලෙස පත් කරනු ලැබූ ඕනෑම තැනැත්තකු අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා ඉවත් කරනු ලැබිය හැකි ය.

4. (1) මිය යෑමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් වුවහොත් මිස, සෑම අධ්‍යක්ෂවරයකුම පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාල සීමාවක් ධුරය දැරිය යුතු අතර, ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය ;

එසේ වුව ද මිය යෑමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් හෝ වෙනත් අයුරකින් ධුරය හිස් වූ අධ්‍යක්ෂවරයා වෙනුවට පත් කරනු ලැබූ අධ්‍යක්ෂවරයෙක්, ධුරය කලින් අත් හැරීමෙන් මිස, තමා අනුප්‍රාප්ත වන අධ්‍යක්ෂවරයාගේ ඉතිරි ධුර කාලය සඳහා ධුරය දැරිය යුතු ය ;

(2) අසනීපවීමේ හෝ අබලතාවක් ඇතිවීමේ හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන සභාපතිවරයා හෝ වෙනත් යම් අධ්‍යක්ෂවරයකු ස්වකීය ධුරයේ කටයුතු තාවකාලිකව ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් වෙනත් යම් අධ්‍යක්ෂවරයකු සභාපතිවරයා ලෙස වැඩ බැලීමට හෝ අවස්ථාවෝචිත පරිදි සභාපතිවරයා හෝ අධ්‍යක්ෂවරයකු ලෙස වැඩ බැලීමට වෙනත් යම් තැනැත්තකු හෝ පත් කරනු ලැබිය හැකි ය.

5. අමාත්‍යවරයා විසින් නිර්ණය කරනු ලැබිය හැකි ප්‍රමාණයක වූ පාරිශ්‍රමිකයන් පුනරුත්ථාපන අධිකාරියේ අරමුදලින් සභාපතිවරයා වෙත සහ අධ්‍යක්ෂවරුන් වෙත ගෙවනු ලැබිය යුතු ය.

6. (1) පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලය පුනරුත්ථාපන අධිකාරියේ ඔහුගේ සාමාජිකත්වයේ කාල සීමාව විය යුතු ය.

(2) අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියකින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) අමාත්‍යවරයා විසින්, ඕනෑම අවස්ථාවක හේතුවක් නොදක්වා සභාපතිවරයාගේ පත්වීම අවසන් කරනු ලැබිය හැකි ය.

7. (1) මේ ජේදයේ වෙනත් විධිවිධානවලට යටත්ව, පුනරුත්ථාපන අධිකාරියේ රැස්වීම් සම්බන්ධයෙන් වන ක්‍රියා පටිපාටිය සහ රැස්වීම්වල කටයුතු පුනරුත්ථාපන අධිකාරිය මගින් විධිමත් කළ හැකි ය.

(2) පුනරුත්ථාපන අධිකාරියේ රැස්වීමක ගණපූර්ණය සාමාජිකයන් තිදෙනෙකු විය යුතු ය.

8. පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි පුරප්පාඩුවක් ඇති වීමේ හෝ එහි අධ්‍යක්ෂ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීමේ දී ඇති වූ යම් දෝෂයක හෝ හේතුව නිසා පමණක් පුනරුත්ථාපන අධිකාරියේ කිසිම ක්‍රියාත්මක තීරණයක් හෝ කටයුත්තක් බල රහිත නොවිය යුතු ය.

9. (1) පුනරුත්ථාපන අධිකාරියේ මුද්‍රාව, එම අධිකාරිය විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි තැනැත්තකුගේ භාරයේ තිබිය යුතු ය.

(2) පුනරුත්ථාපන අධිකාරියේ මුද්‍රාව එම අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු යම් සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට අත්සන් කළහොත් මිස, පුනරුත්ථාපන අධිකාරියේ කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට එම අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු ය.

(4) පුනරුත්ථාපන අධිකාරියේ මුද්‍රාව තබනු ලැබෙන යම් සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට ද එම සාධන පත්‍ර හෝ ලියවිලි පිළිබඳ ලේඛනයක් පුනරුත්ථාපන අධිකාරිය විසින් පවත්වනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත් වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.